# Ready for harvesting - (Sam J - 13 Jan 19)

## <u>අස්වැන්න රැස්කරගැනීමට සූදානම්-</u>

මේ වසරේ අප අවධානය යොමුකරන කාරණා දෙකක් ගැන මම කතා කළා- 1. මිනිස්සු (අස්වැන්න) 2. ස්තුතිදීම (නිතරම ගුණවන්තවීම)

2019 දී අපගෙන් කීදෙනෙක් යම්කිසි වෙනස් දෙයක් අපේක්ෂා කරනවාද කියා මම මවිත වෙනවා. අපගෙන් කීදෙනෙක් අප අවට සිටින අයගේ ජීවිත කෙරෙහි යම් බලපෑමක් ඇති කරන්නට සොයනවාද. අපි මිනිසුන් කෙරෙහි අවධානය යොමු කරන විට අපි ගැනම දක්වන අවධානය අඩුවන බව මම කීවා. ඔබේ අවශ්‍යතාවයන් ගැන වටා හැමදේම නිතරම කැරකෙනවා නම් ඒ හැම වෙලාවෙම ඔබ, ඔබ, ඔබ ගැන පමණක් නම් ඔබේ බිම් කොටස ඔබට මගහැරී ඇත. තමා මුල්කර ගැනීමෙන් සහ තමා ගැනම අවධානය දීමෙන් අපි මේ උගුලට පහසුවෙන්ම අසුවිය හැකියි. අනික් අය සදාකාල විනාශයට යද්දී අපි පමණක් ක්‍රිස්තුස්වහන්සේ තුළ ජීවිතය ගැන ප්‍රීතිවීම සෑහෙන්නේ නැත.

1. සහතික වූ අස්වැන්න ගලාති 6:7-10 අස්වැන්න සහතිකයි *ගලාති 6:7-10 (මැසේජ් බයිබලය) 7-8 නොරැවටෙන්න. දෙවියන්වහන්සේට සරදම් කරන්නට කාටවත් බැරිය. මනුෂ්‍යයෙක් තමා වපුරන දේම කපා ගන්නේය. ඒ හැටියට අනෙක් අයගේ අවශ්‍යතා ගැන සහ දෙවියන්වහන්සේ ගැන නොසළකා! තමා ගැන පමණක් සිතා (මාංශය සඳහා) වපුරන්නා (මාංශයෙන් කුණුවීම) වල් පැළෑටි අස්වැන්නක් කපා ගන්නේය. ඔහුගේ ජීවිතය සඳහා ඔහුට වපුරන්නට තිබෙන්නේ ඔහුගේ වල් පැළෑටි පමණක්ය! එහෙත් දෙවියන්වහන්සේගේ ආත්මයාණන්ට ඔහු තුළ වර්ධනය කරන ක්‍රියාව කරන්නට ඉඩ දෙමින් දෙවියන්වහන්සේ සඳහා වපුරන්නා සබෑ ජීවනයේ සහ සදාකාල ජීවනයේ අස්වැන්නක් නෙලා ගන්නේය.*

*9-10 තවද යහපත්කම් කිරීමට මැළි නොවෙමු. මක්නිසාද අපි අත්හැර නොදමා, නොනවත්වා සිටියොත් නියම කාලයේදී හොඳ අස්වැන්නක් නෙලා ගන්නෙමු. එබැවින් දැන්ම අපට අවස්ථාව ලැබෙන හැටියට, සියල්ලන්ටම, ප්‍රධානකොට අපට කිට්ටුම අයට එනම් ඇදහිල්ලේ පවුලට අයිතිවූවන්ට, යහපත්කම් කරමු.*

සහතික කරන ලද අස්වැන්නක් අපට තිබේ- අපි කීදෙනෙකුට අස්වැන්න රැස්කරන්නන් වීමට ඕනෑද? අපි කීදෙනෙකුට අපේ වැඩවල ඵල දකින්නට ඕනෑද? අපි කීදෙනෙකුට ඇත්තටම ප්‍රතිඵල ඕනෑද?

ඔබේ අරමුණු, ඉටුකර ගැනීමට තිබෙන අභිලාෂයන් සහ ඒවා ඉටුකර ගැනීමටත් ප්‍රතිඵල දැකීමට උනන්දුවක් සහ ඒවා හිමිකර ගැනීමට පෙළඹෙන අන්දම ගැන ලිවීමට අනවශ්‍යයයි කියන එකම සංස්ථාවක්වත් මේ සංස්ථාපිත ලෝකයේ නැත. ඒ ඇයි? ව්‍යාපාරය ලාභ ලැබිය යුතුය. එසේ සිදු විය හැකි වෙන්නට නම් හොඳට සැලසුම් කළ සහ මෙහෙයවන ලද වැඩකරන බලකායක අවධානයක් අවශ්‍ය නිසාය. සෑම පුද්ගලයෙක්ම ඉටුකර ගැනීමට උද්යෝගීමත් වුනොත් මුලු කොම්පැනියම ජයගන්නා බව ඔවුන් දනිති. බයිබලය ඉතා පැහැදිලියි- පුද්ගලයෙක් වපුරනදේම ඔහු කපා ගන්නේය. පැහැදිලි අවවාදයයි! නොරැවටෙල්ලා, අපගේ මැවුම්කාර දෙවියන්වහන්සේට සරදම් කරන්නට නොහැක! ප්‍රශ්නය මෙයයි, අන් අයගේ ජීවිතවල වවන්නට, වපුරන්නට හෝ ආයෝජනය කරන්නට අපි කොපමණ වෙලාවක් සහ ශ්‍රමයක් වැය කරනවාද? මිනිසුන් වෙනුවෙන් අප කරන ආයෝජනයේ ප්‍රමාණයට අනුව අප ලබන්නට යන අස්වැන්න කොපමණ ලොකුද කියා තීරණය වෙනවා ඇත. කෙතෙහි තම බීජ වපුරන්නට අකැමති යම්කෙනෙක් එයින් කිසිම දෙයක් අපේක්ෂා කළ නොහැක. එය හරියට බැංකු ගිනුමක් හෝ ව්‍යාපාරයක් වැනිය. ඔබට ආපසු යමක් ලබාගැනීමට නම් ඔබ මුලින්ම ආයෝජනය කළ යුතුය. ඔවුන්ගේ ගැලවීම දකින පිණිස මිනිසුන් සමග ඔබ කාලය ගත කළ යුතුව තිබේ. ඔබ වපුරමින් සිටින බැවින් එය ඉක්මනින් හෝ පසුකාලයක සිදුවෙනවාම ඇත. අප වැපිරිය යුතුව තිබෙන ස්ථාන ගැන උදාහරණ: අපගේ පවුල්වලට- දේව වචනය ඉගැන්වීම සහ අධ්‍යයනය කිරීම, ළමයින්- දෙවියන්වහන්සේගේ දේවල් සහ සභාව ගැන ඉගැන්වීමට සහ ධෛර්‍යමත් කිරීමට වෙලාව යෙදවීම, අසල්වාසීන්- ප්‍රේමය සහ සැළකිලිමත්කම වැපිරීම, සභාව- සේවය කරන්නට සහ ආශීර්වාදයක් වීම සඳහා වැඩිපුර (සැතපුමක් යාම) යමක් කිරීම, රැකියා- නිතරම කැමැත්තෙන් සහ විශ්වාසවන්තව, ඉතාමත් හොඳින් වැඩ කිරීම.

2. දෙවියන්වහන්සේගේ ආත්මයාණන් විසින් ක්‍රියාත්මකවීම- ශුද්ධාත්මයාණන් වහන්සේ- ජීවනය සහ සදාකාල ජීවනය අධිකව දීමට සහතිකවෙයි. අප ආත්මික දේවල්වලට වපුරන විට සහ ශුද්ධාත්මයාණන් තුළින් ක්‍රියාත්මක වන විට, අපට පූර්ණ ජීවිතයක් ජීවත්වීමට සහතිකවී තිබේ, භාගයකට නොවේ. ශුද්ධාත්මයාණන් නමැති පුද්ගලයා කොතරම් වැදගත්ද? මේ පොළොවෙන් යන්නට පෙර යේසුස්වහන්සේ උන්වහන්සේගේ ගෝලයන්ට වෙනත් උපකාර කරන්නෙක් එවන බවට පොරොන්දුවූසේක. <u>*යොහන් 14:16-17*</u> *මම පියාණන්වහන්සේගෙන් ඉල්ලන්නෙමි, එවිට උන්වහන්සේ නුඹලා සමග සදාකල්ම සිටින පිණිස වෙන සැනසිලිකාරයෙකු නුඹලාට දෙනසේක. ඒ සැනසිලිකාරයාණෝ සත්‍යතාවේ ආත්මයාණන්වහන්සේය. උන්වහන්සේව පිළිගන්නට ලෝකයාට බැරිය; මක්නිසාද ලෝකයා උන්වහන්සේව දකින්නේවත් අඳුනන්නේවත් නැත. නුඹලා උන්වහන්සේව අඳුනන්නහුය; මක්නිසාද උන්වහන්සේ නුඹලා සමග නැවතී සිටිනසේක, නුඹලා තුළෙහි සිටිනසේක.* ශුද්ධාත්මයාණන්ට අප සමග සහ අප තුළෙහි වාසය කරන පුද්ගලයා ලෙස යේසුස්වහන්සේ ප්‍රමුඛත්වය දුන්සේක.

මිනිසුන්ගේ ජීවිත කෙරෙහි බලපෑමක් ඇති කරන්නට නම් අපට එය අපේම වෑයමෙන් හෝ අපේම ජනකාන්ත භාවයෙන් හෝ අපේම ශක්තියෙන් කළ නොහැක. එය ශුද්ධාත්මයාණන්වහන්සේගේ මාර්ගයෙන් සහ උන්වහන්සේ තුළින් කළ යුතුව ඇත.

යේසුස්වහන්සේ මෙසේ කීසේක. යොහන් 15: අප උන්වහන්සේ තුළත් උන්වහන්සේ අප තුළත් පවතින විට අප බොහෝ ඵල දරන්නෙමුව, උන්වහන්සේ නැතුව අපට කිසිවක් කළ නොහැක. එබැවින් ශුද්ධාත්මයාණන් ඒ තුළ නැත්නම් යම්දෙයක් පෙන්වන්නට වෑයම් කිරීම වැඩක් නැත, මක්නිසාද එය පලක් නැති දෙයක් වෙනු ඇත. උන්වහන්සේ පොරොන්දුවූනු ශුද්ධාත්මයාණන්වහන්සේ උදෙසා යෙරුසලමෙහි රැඳී සිටින්නැයි ක්‍රියා 1:4 හි යේසුස්වහන්සේ තම ගෝලයන්ට අණ කළසේක. ඒ ඇයි? මක්නිසාද ඔවුන්ට සාක්ෂිකාරයන් වීමට බලය ලැබෙන්නේ උන්වහන්සේ කෙරෙන් නිසාය. ඔබට ශුද්ධාත්මයාණන්වහන්සේ නැතුව ක්‍රියාත්මක විය නොහැක. ඔබ තුළ තිබෙන බලාගාරය උන්වහන්සේය. ශුද්ධාත්මයාණන්වහන්සේ ලැබූ විගසම ගෝලයන් කොතරම් නිර්භීත වුනාද කියා ක්‍රියා පෙතෙන් ඔබට කියවිය හැකියි. පේතෘස් නැගිට දේශනා කළවිට 3000ක් ගැලවීම ලැබුවෝය.

සුදර්ශන දොරටුව අසල සිටි කොරා දෙස බලා, ඇවිදින ලෙස ඔහුට අණ කිරීමට තරම් පේතෘස් සහ යොහන් එඩිතර වූහ-ඒ ශුද්ධාත්මයාණන්" වහන්සේගේ බලයයි; ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් අපෝස්තුලුවරුන් තුළින් බොහෝ ලකුණු සහ පුදුම දේවල් කරවන ලදී. උන්වහන්සේගේ අසවැන්නට සේවකයෙක් ලෙස ඔබව යවන්නට දෙවියන්වහන්සේට හැකිවන පිණිස ඔබගේ අස්වැන්න කුමක්ද සහ තිබෙන්නේ කොහේද කියා ක්ෂණිකව යාන්තම් හෝ පෙන්නුම් කරන්න සහ ඔබට සේවක හදවතක් දෙන්න කියා ශුද්ධාත්මයාණන්වහන්සේගෙන් ඉල්ලන්න.

දෙවියන්වහන්සේ, පහසුවෙන්ම විඩාවට පත්වී අත්හැර නොදමන, නොසැලී ස්ථිරව සිටින සේවකයන් සොයමින් සිටිනසේක.

උන්වහන්සේගේ රාජ්‍යයට මුල්තැන දෙමින්, ඔවුන්ගේ මුලු හදවතින්, ආත්මයෙන් සහ ශක්තියෙන් උන්වහන්සේට සේවය කරන්නට කැමති මිනිසුන් දෙවියන්වහන්සේ සොයමින් සිටිනසේක. උන්වහන්සේගේ හඬට කීකරුවීමට සහ උන්වහන්සේගේ අස්වැන්ට යාමට කැමති සෙනගක් සොයමින් සිටිනසේක.

එමනිසා නවත්තන්න එපා, දිවීම අත්හරින්න එපා, දෙවියන්වහන්සේගේ පවුල ගැන අතහැර දමන්න එපා. මක්නිසාද ඔබේ අස්වැන්නෙහි ජයග්‍රාහී ලෙස කඩා බිඳගෙන යාමක් සිදුවෙන කාලය මෙයයි.